# පුංචි ශානිකා



ඉලිෂා සුභසිංහ

# පුංචි ශානිකා

කර්තෘ සහ චිත්‍ර

**ඉලීෂා සුහසිංහ**

## කර්තෘගේ වෙනත් කෘති

- ගෙදරට ආ අමුත්තා

**පුංචි ශානිකා**
ඉලීෂා සුහසිංහ

**ISBN: 978-624-208-473-2**

# පිදුම

මාගේ ආදරණීය පවුලේ සියලු දෙනාටත්,
මාගේ හැකියාවන් ඉහළ තලයකට ගෙන ඒමට
සහය වූ සියලු ගුරු මෑණිවරුන්ටත්,
පියවරුන්ටත්, මා හට උදව් උපකාර කළ
සියලු දෙනාටත් පුදමි
මෙම ග්‍රන්ථය සදා බැතියෙන්!

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසා ය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම ඊට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත් වීම සුවිශේෂී සිදුවීමකි.


ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කර්තෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමු කරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය හා ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතර ම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේ ම තම සහජ කුසලතාවය හඳුනාගනිමින් ලේඛනකරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමාන ය.


විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර




දුෂ්කර ගම්මානයක එක්තරා පවුලක මවක්, පියෙක් සහ දියණියක් ජීවත් වුහ.




එම පවුලේ පියා දිනක් කොස් ගෙඩියක් කැඩීමට ගොස් මිය ගියේ ය. එතැන් පටන් මව කුලී වැඩ කරමින් දියණියගේ වැඩ කටයුතු කිරීම සඳහා ඉතා වෙහෙස මහන්සි වූවා ය.




එසේ වූ නමුත් මෙම දියණිය ඉගෙනීමට එතරම් කැමැත්තක් නොදැක්වූ අතර හිතුවක්කාර ගති පැවතුම් ඇති තැනැත්තියක් විය.



මෙසේ කාලය කෙමෙන් කෙමෙන් ගතවන විට මෙම දියණිය පාසල් ගමන අතරමග නතර කොට මවගේ දැඩි අකමැත්ත මත ගමේ වැඩිමහල් අක්කා කෙනෙකුගේ මාර්ගයෙන් කොළඹ රැකියාවක් සොයා ගෙන, ඒ සඳහා පිටත් විය.



එහි දී වැඩපොළෙන් හඳුනා ගත් කෙනෙකු සමග සිය මවට නොකියා විවාහ වී වැඩපළ අසල නිවාසයක ඇ ජීවත් වූවා ය. දින කිහිපයකට පසු මේ බව දැනගත් ඇගේ මව තම දියණියගේ හිතුවක්කාරකම් පිළිබඳ ව සිතමින් දැඩි ශෝකයෙන් කාලය ගත කරන්නට විය.



මෙසේ කාලය ගත වන විට ඇයගේ කුසට දරුවකු පැමිණි  අතර ඉන් පසු මාස කිහිපයකින් පියා ඔවුන් අතහැර ගියේ ය.



ඉන් පසු රැකියා කටයුතු කිරීමේ දී ඈ දැඩි අපහසුතාවලට මුහුණ දුන්නා ය. මේ අතරතුර සිය දරුවා මෙලොව එළිය දුටුවා ය.



වැඩි කල් ගතවන්නට පෙර ඇයට මෙය ඉතා විශාල බරක් සේ දැනුණු අතර ටික දිනකින් ඇ සිය දියණිය ළමා නිවාසයකට භාර දුන්නා ය. එතැන් පටන් ඇය සිය දියණිය ගැන නැවත සොයා බලන්නට වුවමනාවක් දැක්වුවේ නැත. මෙම පුංචි දියණිය ශානිකා නම් විය.



පසුව මෙම සිද්ධීන් සමුදාය පිළිබඳ ව ආරංචි වී තම දියණිය පිළිබඳ ව කලකිරුණු ශානිකාගේ අත්තම්මා, කොළඹට පැමිණ ළමා නිවාසයෙන් සිය මිනිබිරිය ව තමා භාරයට ගත්තා ය.




එතැන් පටන් පුංචි ශානිකා දුෂ්කරතා ගොන්නකට මුහුණ දෙමින්, රජයේ විවිධ සහනාධාරවල ද උපකාරයෙන්, තම අත්තම්මාගේ සෙනෙහස මැද ජීවත් වුවා ය.




ඇය ටිකෙන් ටික ලොකු වී පාසල් යන වයසට පත් විය. අත්තම්මා විසින් ශානිකාව ගමේ පාසලට ඇතුළත් කරන ලද අතර ගමේ දහම් පාසලට ද යවන ලදි.



ශානිකා දක්ෂ දැරියක් වූ අතර ඇය තම මව මෙන් නොව, ගුණ යහපත් දැරියක් ද විය. කාලයාගේ ඇවෑමෙන් තම මවගේ ක්‍රියාකලාපය පිළිබඳ ව දැනගත් ශානිකා, හොඳින් ඉගෙනගෙන කෙදිනක හෝ තම අත්තම්මාට තම යුතුකම් ඉටු කරන බවට අදිටන් කරගත්තා ය.



ඇයට සිය ගුරුවරුන්ගේත්, ගමේ සියලු දෙනාගේත්, ආශීර්වාදය හා ආදරය නොඅඩු ව ලැබුණි. කෙමෙන් කෙමෙන් කාලය ගත වන විට, ඈ සිය ජීවිතයේ පළමු කඩයිම් විභාගයට මුහුණ දුන්නා ය.




එම විභාගයෙන් ඉතා විශිෂ්ට ලෙස ඇය සමත් වූ අතර, ගමේ පුංචි පාසලේ ශිෂ්‍යත්වය සමත් වූ පළමු දරුවා ලෙස පාසලේ ඉතිහාසයට ද එක් විය.



ඉන් පසු ඇය නගරයේ ඇති ප්‍රධාන බාලිකා පාසලකට ඇතුළත් වූ අතර විවිධ දුෂ්කරතා මධ්‍යයේ වුවත් ඇය තම අධ්‍යාපන කටයුතු අත්හැරියේ නැත. ඈ පාසලේ ක්‍රීඩා කටයුතුවලට ද සහභාගී වී ජයග්‍රහණ ලැබුවා ය.

ඇයගේ අනාගත බලාපොරොත්තුව වන්නේ ඇය සිටි ගමේ ගෙවල් නාය ගිය අවස්ථාවේ ආධාර ලබා දීමට පැමිණි ප්‍රාදේශීය ලේකම්තුමිය වැනි රජයේ ඉහල නිලධාරිණියක් වී තම ගමේ ගම්වැසියන්ට සේවය කිරීමයි.

නිමි



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍යය ප්‍රබෝධයත්, අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත්, සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇති ව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැටදහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍යය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩ ව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කරගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතු ය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවෙකින්වත් ලබා දිය නොහැක. මානව දැනුම ගබඩා කර තබා ගැනීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණ යුගයේ ස්මාර්ට් බල පරම්පරාව නූතන තාක්ෂනය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවෙන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ දිවියට මාගේ සුභාෂිංශන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

ISBN: 978-624-208-473-2